# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1814/61 - 2013 ජූනි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

LA/2048.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ වල්මෝරුව ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 ජූනි මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/990.

**උපලේඛනය**

මාතලේ දිස්ත්‍රික්කයේ පල්ලේපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක E416B, මොරගස්පිටිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මොරගස්පිටිය ගමේ පිහිටි, මහවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | එස්. බී. විමලසිරි මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | කොහොලන්විල - පල්ලේපොල මාර්ගය ; |
| *දකුණට* | : | පල්ලේපොල කොහොලන් විල මාර්ගයේ සිට මොරගස්පිටිය දක්වා යන මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. කේ. එම්. දසනායක මයා,
මොරගස්පිටිය,
මහවත්ත,
පල්ලේපොල.

06 - 785


1A - G 17801 — 315 (2013/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

LA/2050.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ රජ්ජම්මන ජල ගබඩා ටැංකිය හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අවශ්‍ය වී ඇති හෙයින්, අත්කර ගැනීමට යෝජිත මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 ජූනි මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/989.

*උපලේඛනය*

මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, E322A රජ්ජම්මන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රජ්ජම්මන ගමේ පිහිටි, අවසාන ගම් පිඹුරු අංක 25 හි කැබලි අංක 120 ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 60 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම පිඹුරේ කැබලි අංක 119, කැබලි අංක 120 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස හා ජනපද පාර ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 120 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *දකුණට* | : | අ. ග. පි. 23 දරන මඩවල ගම හා කැබලි අංක 120 දරන මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | කැබලි අංක 119 හා අ. ග. පි. 23 දරන මඩවල ගම. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :* 1. මාකාවිටකගේ නීල් පෙරේරා මහතා,
අංක 120, විශේෂ ව්‍යාපාර ජනපදය,
රජ්ජම්මන.

06 - 786

---

LA/2053.

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, එකී මණ්ඩලයට, විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ පන්සලාතැන්න ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මෙම නියමයෙන් අනුමත කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 ජූනි මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැඳුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/991.

උපලේඛනය

මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, E347A හලංගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පන්සලාතැන්න ගමේ පිහිටි, පන්සලාතැන්න වත්ත මාඋස්සාගොල්ල කොටස නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :–

| | | |
|---|---|---|
| *උතුරට* | : | පන්සලාතැන්න වත්ත පාර ; |
| *නැගෙනහිරට* | : | පන්සලාතැන්න වත්ත පාර ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය :*

1. විධායක අධ්‍යක්ෂ,
සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම,
අංක 320, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

06 - 787

---

LA/1482.

ශුද්ධි පත්‍රය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය, දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, 2011.12.28 දිනැති අංක 1738/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 4A හා 5 A පිටු වල අංක 01 - 277 යටතේ පළ කරන ලද නිවේදනයේ උපලේඛනයෙහි "ඉඩමේ ප්‍රමාණය අක්කර : 04 රූඩ් : 03 පර්චස් : 30 ක් පමණ" යනුවෙන් සඳහන් වුවත් එහි ප්‍රමාණය අක්කර : 05 රූඩ් : 01 පර්චස් : 28.50 ක් වශයෙන්ද, "ඉඩමේ නම ගොඩ ඉඩම" යනුවෙන් සඳහන් වුවත් වවුනියාව මැනුම් අධිකාරිගේ අංක Va/VAV/ 2012/051-054 දරන ප්‍රගමන අනුරේඛණය අනුව ඉඩමේ නම ''පෙරියකුලම්කාඩු'' වශයෙන්ද, සංශෝධනය කරන ලද බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය.

2013 ජූනි මස 07 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/950.

06 - 788

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.